පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 489

ආයතනයේ නම - ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපල කාර්යාලය

පාර්ලිමේන්තුවේ රජයේ ඇඟුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம்: 489
நிறுவனத்தின் பெயர் : இலங்கை தேசிய புலமைச் சொத்துக்கள் அலுவலகம்
பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புகளும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Parliamentary Series No. 489
Name of Institution: National Intellectual Property Office Of Sri Lanka
Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119(4)

වසන්ත සමරසිංහ (ප්‍රා.ම)
වෙළෙඳ, වාණිජ, ආහාර ද්‍රව්‍යාපෘති සහ
සමුපකාර සංවර්ධන අමාත්‍ය
අංක 492, ආර්.ඒ. ද මැල් මාවත
කොළඹ 03.

ආකෘති පත්‍ර අංක **01**

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය - **489**

ආයතනයේ නම - ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය

වාර්තාවෙන් හඳුනාගත් අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග/ වත්මන් තත්ත්වය
01. කඩිනමින් අදාල බඳවාගැනීම් කිරීමට කටයුතු කරන ලෙස කාරක සභාව විසින් අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි සහ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ ග.නි වෙත නිර්දේශ කරන ලදී.	ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ පේටන්ට් පරීක්ෂක සහ බුද්ධිමය දේපළ නිලධාරීන් බඳවා ගැනීමේ කටයුතු අවසන් කර ඇති අතර ඒ අනුව 2025.04.01 දිනැතිව පේටන්ට් පරීක්ෂක නිලධාරීන් 08 ක් සහ 2025.08.01දින බුද්ධිමය දේපල නිලධාරීන් 11 දෙනකු බඳවා ගැනීම් කටයුතු අවසන් කර ඇත. එම බඳවා ගැනීම්වලට අදාළ විභාගය සඳහා කාර්යාලයේ සේවය කරනු ලබන නිලධාරීන්ටද පෙනී සිටීමට හැකි වන පරිදි විභාගය ගැසට් කරන ලදී. ඒ අනුව තරග විභාගයේ ප්‍රතිඵල මත නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කර ඇත.
02. දෙපාර්තමේන්තුමය තනතුරක් වන එම තනතුරට මේ වන විට ස්ථානමාරු කර ඇති ශ්‍රී ලංකා පරිපාලන සේවා නිලධාරිනිය 2017 වසරේදී අනුයුක්ත කරනු ලැබුයේ එවකට ආයතනය තුල නියමිත ජ්‍යෙෂ්ඨතාවය සම්පූර්ණ කළ නිලධාරීන් නොසිටි නිසා නමුත් මේ වන විට එම තනතුරට පත් කළ හැකි වසර 11 ක ජ්‍යෙෂ්ඨතාවය සම්පූර්ණ කළ නිලධාරීන් දෙපාර්තමේන්තුව තුළ සිටින බව සැලකිල්ලට ගත් කාරක සභාව නියමිත ක්‍රම වේදය අනුගමනය කරමින් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් අතුරින් සුදුසු නිලධාරියෙකුට එම රාජකාරී ඉටු කිරීම පැවරිය හැකි බවත්, ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමග සාකච්ඡා කර නිසි පියවර ගන්නා ලෙසත් වෙළඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිකතා අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. සහ ජාතික බුද්ධිමය දේපල කාර්යාලයේ ග.නි වෙත නිර්දේශ කරන ලදී.	ලබාදී ඇති නිරීක්ෂණ හා නිර්දේශ එපරිදි වේ.

වසන්ත සමරසිංහ (ප්‍රා.මු)
වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ
සමූපකාර සංවර්ධන අමාත්‍යාංශ
අංක 492, ආර්.ඒ. ද මැල් මාවත,
කොළඹ 03

03. ඉහත කරුණු සැලකිල්ලට ගත් කාරක සභාව මෙම විෂයය සහ ඒ හා සම්බන්ධිත ගැටළු ජාතික බුද්ධිමය දේපල කාර්යාලයටම විශේෂිත වූ කරුණු වන බැවින් ඒවා පාර්ලිමේන්තුවට යොමු කර අවශ්‍ය ප්‍රතිපත්තිමය නෛතික අනුමතයන් හා ප්‍රතිපාදනයන් සැලැස්වීමට හැකි වන අයුරින් මෙම ගැටළුව විසඳීමට සුදුසු යෝජනාවලියක් ඇතුලත් වාර්තාවක් මාස 03 ක් ඇතුළත කාරක සභාවට යොමු කරන මෙන් ප්‍ර.ග.නි සහ ග.නි වෙත නිර්දේශ කරන ලදි.	**වෙළඳ ලකුණු ලියාපදිංචිය ප්‍රමාද වීම** 2026 ජුනි මස අවසන් වන විට මාස 03 ක පොරොත්තු කාලයක් මත වෙළඳ ලකුණු පරීක්ෂා කර අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. ලිපිගොනු ඩිජිටල්කරණ ව්‍යාපෘතිය වෙනුවෙන් සති අන්තයේ හා රාත්‍රී කාලයේ නිලධාරීන් යොදවා කටයුතු කිරීමට සැලසුම් කර තිබුණද, ව්‍යාපෘතිය සඳහා ගෙවීම් අනුමත කර ගැනීමට අපහසු වීම මත නිලධාරීන් සාමාන්‍ය රාජකාරි කාලය තුලදී බුද්ධිමය දේපල ලේඛන පරිලෝකනය කිරීම සඳහා යොමු කරන ලදි. එසේම, පරිලෝකනය කරන ලද ලේඛන වල නිවැරදි බව පරීක්ෂා කර තහවුරු කිරීම නිලධාරීන් විසින් සිදු කරන ලද්දේද සාමාන්‍ය රාජකාරී කාලය තුළදීය. (වෙළඳ ලකුණු ශාඛාවේ පමණක් වෙළඳ ලකුණු ගොනු 131080 ක ප්‍රමාණයක් පරිලෝකනය කර ඇති අතර, එම සියලුම ගොනුවල ව්‍යාපෘතියට අදාල කටයුතු සිදු කිරීම එම නිලධාරීන්ම විසින් සිදු කරන ලද බව මෙහිදී සඳහන් කළ යුතුය.) ඒ අනුව, අප අපේක්ෂා කළ පරිදි, පොරොත්තු මාස 03 ක කාලයක් තිබියදී වෙළඳ ලකුණු පරීක්ෂාවන් අවසන් කිරීමට නොහැකි විය. 2026 මැයි මස වන විට ලිපිගොනු පරිලෝකනය කිරීමේ කටයුතු මූලික වශයෙන් අවසන් කර ඇති බැවින්, ඉදිරි මාස 06 අවසානයේදී මාස 03 ක පොරොත්තු කාලයක් මත වෙළඳ ලකුණු පරීක්ෂා කර අවසන් කිරීමට හැකි වනු ඇත. **පේටන්ට් හා කාර්මික සැලසුම් ලියාපදිංචිය ප්‍රමාද වීම** මේ වන විට පේටන්ට් හා කාර්මික සැලසුම් ලියාපදිංචිය සඳහා දේශීය පේටන්ට් අයදුම්පත් 483 ක් ද පැරිස් සම්මුතිය යටතේ අයදුම්පත් 46ක් ද කාර්මික සැලසුම් 104 ක් ද පමණ පරීක්ෂා කිරීමට පවතී. නිළධාරී හිඟය හේතුවෙන් පේටන්ට් පරීක්ෂක නිළධාරීන් 2025.08.01 දින බඳවා ගනු ලැබූ අතර ඔවුන්ගේ වසරක සුහුණු කාලය 2026.08.01 දිනට සම්පූර්ණ වේ. මෙම අංශයේ සියලු නිළධාරීන් ලෝක බුද්ධිමය දේපළ සංවිධානය මඟින් ලබා දෙන ලද ව්‍යාපෘතියක් වන බුද්ධිමය දේපළ ලේඛණ පරිලෝකන ව්‍යාපෘතියේ කටයුතු සඳහා මෙන්ම පරිලෝකනය කරන ලද ලේඛණ වල නිවැරදිතාවය පරීක්ෂා කිරීමේ කටයුතු සඳහාද ශ්‍රමය සහ කාලය වැඩි වශයෙන් වෙන් කිරීමට සිදුවීය. ලිපිගොනු පරිලෝකන ව්‍යාපෘතිය වෙනුවෙන් සති අන්තයේ හා රාජකාරි වේලාවෙන් පසුව නිළධාරීන් යොදවා කටයුතු කිරීමට සැලසුම් කර තිබුණද ව්‍යාපෘතිය නියමිත කාලය තුළ අවසන් කළ යුතු වීමත් ව්‍යාපෘතිය සඳහා ගෙවීම් අනුමත කර ගැනීමට අපහසුවීමත් මත නිළධාරීන් සාමාන්‍ය රාජකාරි කාලය තුළද ව්‍යාපෘතියේ කටයුතු සිදු කරන ලදී.එබැවින් පේටන්ට් හා කාර්මික සැලසුම් අංශයේ රාජකාරී සැලසුම් කල පරිදි ඉටු කර ගැනීමට නොහැකි විය. ලේඛණ පරිලෝකන ව්‍යාපෘතියේ කටයුතු මේ

වසන්ත සමරසිංහ (ජා.මු)
වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ
සමූපකාර සංවර්ධන අමාත්‍ය
අංක 492, ආර්.ඒ. ද මැල් මාවත,
කොළඹ 03.

	වන විට සාර්ථකට අවසන් කර ඇති බැවින් ඉහත අයදුම්පත් ප්‍රමාණයන් පහත පරිදි අවසන් කිරීමට බලාපොරොත්තුවේ. ඒ අනුව එක් පරීක්ෂකවරයෙකුට මාසිකව පේටන්ට් සෝදිසි කිරීම් අයදුම්පත් 8 බැගින් වූ මාසික ඉලක්කයක් පරීක්ෂකවරු 8 දෙනාට ලබා දී 2027 පෙබරවාරි මාසය වන විට 2026.06.30 දක්වා අයදුම්පත් වල පරීක්ෂාවන් අවසන් කිරීමට බලාපොරොත්තුවේ. කාර්මික සැලසුම් අයදුම්පත් පවතින්නේ 104ක පමණ ප්‍රමාණයක් වන අතර එම ප්‍රමාණය 2026 නොවැම්බර් මාසය වන විට අවසන් කිරීමට බලාපොරොත්තුවේ. මීට අමතරව පේටන්ට් සහයෝගීතා ගිවිසුම (PCT) යටතේ ගොනු කරනු ලබන අයදුම්පත් අන්තර්ජාතික සෝදිසි වර්තා සමග ඉදිරිපත්වේ.එහිදී එම අන්තර්ජාතික සෝදිසි වර්තාවල පවතින කරුණු මෙන්ම එම අයදුම්පත් සම්බන්ධයෙන් කාර්මික වශයෙන් දියුණු රටවල පේටන්ට් ප්‍රදානය කිරීමේ තීරණද සලකා බලා එම අයදුම්පත් සඳහා පේටන්ට් බලපත්‍ර ලබාදීමේ හැකියාව තීරණය කරණු ලැබේ.ඒ අනුව මේ වන විට පවතින PCT අයදුම්පත් 542 අතරින් ඉහත දක්වා ඇති පරිදි අන්තර්ජාතික සෝදිසි වර්තා සහ වෙනත් රටවල තීරණද සලකා බලා කටයුතු අවසන් කල හැකි අයදුම්පත් 2027 පෙබරවාරි මස අවසන් කිරීමට අපේක්ෂිතය.
04. එකී කටයුතු සම්බන්ධයෙන් දේශීය වෛද්‍ය, කලා, ක්‍රීඩා සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ආයතනයන් සමඟ මෙම කාර්යාලය ඒකාබද්ධව කටයුතු කළ යුතු බව ප්‍රග.නි සහ ග.නි වෙත කාරක සභාව විසින් උපදෙස් ලබා දෙන ලදි.	2003 අංක 36 දරන බුද්ධිමය දේපල පනතෙහි 05 වන වගන්තිය ප්‍රකාරව ජන කතා, ජන ගී, ජන නැටුම්, සම්ප්‍රදායික චිත්‍ර, නැටුම්, මූර්ති, හස්ත කර්මාන්ත, ඇඳුම් පැළඳුම් ආදී ජන කලා නිර්මාණ 'ජනප්‍රවාද ප්‍රකාශන' ලෙස අර්ථ දක්වා ඇත. එම පනතෙහි 24(1) වගන්තිය ප්‍රකාරව, වාණිජ කාර්යයන්හිදී හෝ සාම්ප්‍රදායික සන්දර්භයෙන් බැහැර කාර්යයන් සඳහා හෝ යථෝක්ත ජනප්‍රවාද ප්‍රකාශන භාවිතා කරන අවස්ථාවලදී, ඒවා ප්‍රති නිෂ්පාදනය, මහජනයා වෙත සන්නිවේදනය, අනුවර්තනය, පරිවර්තනය හෝ වෙනත් ආකාරයක විපර්යාස කිරීම වළක්වා ඇත. එබඳු අවස්ථාවලදී, නියමිත ගාස්තුවක් ගෙවීමට යටත්ව එම කාර්යයන් සඳහා බලය දීමේ අයිතිවාසිකම 'නිසි බලධරයා' සතු බව පනතෙහි 24(2) වගන්තියෙහි සඳහන් වේ. මෙකී 24(2) වගන්තිය යටතේ කියවිය යුතු, 2005 අංක 01 දරන බුද්ධිමය දේපල රෙගුලාසිවල 4(1) රෙගුලාසිය ප්‍රකාරව අදාල 'නිසි බලධරයා' වන්නේ 'බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල්වරයාය'.

වසන්ත සමරසිංහ (ජා.ඔ)
වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ
සමූපකාර සංවර්ධන ඇමතිතුමා
අංක 492, ආර්.ඒ. ද මැල් මාවත,
කොළඹ 03

	එසේම, පනතෙහි 24(6) වගන්තිය ප්‍රකාරව ජනප්‍රවාද ප්‍රකාශන අනවසරයෙන් භාවිතා කරන්නන්ට එරෙහිව නීතිමය පියවර ගත හැක. මේ අනුව, ජනප්‍රවාද ප්‍රකාශන ආරක්ෂා කිරීම සඳහා වන යාන්ත්‍රණයක් බුද්ධිමය දේපල පනතෙහි අන්තර්ගත වන බව පැහැදිලි වේ. එසේම පනතෙහි 22(3) වගන්තියෙහි දැක්වෙන්නේ මෙම අයිතීන් උල්ලංඝනය වීමෙන් අගතියට පත්වන පිරිස් ඇතොත්, ඔවුන්ට බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කර, නොමිලේ ක්‍රියාත්මක කරනු ලබන 'ගැටුම් නිරාකරණ' ක්‍රමවේදය හරහා විසඳුමක් ලබා ගත හැකි බවයි. මෙම ක්‍රමවේදය ක්‍රියාත්මක වන ආකාරය 2005 අංක 01 දරන බුද්ධිමය දේපල රෙගුලාසිවල අංක 03-10 දක්වා වූ රෙගුලාසිවල අන්තර්ගත වේ.
05. අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඉල්ලුම් කිරීමට අවශ්‍ය සියලුම තොරතුරු සම්බන්ධයෙන් ලෝක බුද්ධිමය දේපල සංවිධානය ලිඛිතව දැනුවත් කර එම ආයතනය වෙතින් අවශ්‍ය තොරතුරු සෘජුවම ලබාගෙන සති දෙකක් ඇතුළත අමාත්‍ය මණ්ඩල අනුමතිය සඳහා ඉල්ලුම් කිරීමට කටයුතු කරන ලෙස අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි වෙත නිර්දේශ කරන ලදී.	ස්කෑන් කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2025.02.20 දින කැබිනට් අනුමැතිය ලැබී ඇත. ඒ අනුව, මෙම ව්‍යාපෘතිය 2025.03.24 දින ආරම්භ කරන ලදී. ව්‍යාපෘතිය ආරම්භයේදී ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ වෙළඳ ලකුණු, පේටන්ට්, කාර්මික සැලසුම් හා ප්‍රකාශන හිමිකම් (Copyright) ලිපි ගොනු සම්බන්ධ පිටු මිලියන 5.2 ක් ස්කෑන් කිරීම සඳහා මූලික අනුමැතිය ලබාගෙන තිබුණි. ඒ අනුව, ලෝක බුද්ධිමය දේපළ සංවිධානයේ (WIPO) අධීක්ෂණය යටතේ අදාළ පිටු ප්‍රමාණය ස්කෑන් කිරීමේ කටයුතු 2026.05.26 දින අවසන් කර, DMS ආයතනය විසින් අදාළ ඉන්වොයිසිය ඉදිරිපත් කරන ලදී. ව්‍යාපෘතියේ ප්‍රගතිය හා අවසන් කිරීමේ කටයුතු සමාලෝචනය කිරීම සඳහා WIPO ආයතනයේ නිලධාරීන්ගේ මෙහෙයුමක් (WIPO Mission) 2026.05.25 දින සිට 2026.05.29 දින දක්වා පවත්වා ඇති අතර ලිපි ගොනු ස්කෑන් කිරීමේ ව්‍යාපෘතියේ ප්‍රගතිය 100% බව එම නිලධාරීන් විසින් තහවුරු කරන ලදී. මෙහිදී මූලිකව පිටු මිලියන 5.2 ක් (ගොනු 200,000) ස්කෑන් කිරීම සඳහා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණ අතර එම මුළු කෝටාවම බුද්ධිමය දේපල කාර්යාලය විසින් භාවිතා කර ඇත. කෑලි ක්‍රමයට ගෙවීම් කිරීමේ ව්‍යාපෘතියක් මගින් පරිලෝකන දත්ත, ස්වයංකරණ පද්ධතියට උඩුගත කොට සත්‍යාපනය කිරීමට නියමතව ඇති අතර අමාත්‍යාංශයේ අනුමැතිය ලද පසුව එම කටයුතු ආරම්භ කෙරේ.
06. බුද්ධිමය දේපල පනතේ පවතින අඩුපාඩු හේතුවෙන් මෙරට ඇතැම් බුද්ධිමය දේපලයන් හි අවභාවිතාවයන් සිදුවන බව අවධාරණය කළ කාරක සභාව, සුදුසු	බුද්ධිමය දේපල පනතේ 1 හා 2 වන පරිච්ඡේද සංශෝධනය කරමින් පනත යාවත්කාලීන කිරීමට ක්‍රියාමාර්ග ගනිමින් පවතින අතර වෙළඳ අමාත්‍යාවරයා විසින් පත් කරන ලද කමිටුවක් මගින් ප්‍රකාශන අයිතිය සම්බන්ධයෙන් නව සංශෝධන ඇතුලත් කෙටුම්පත අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නියමිතය.

විසන්ත [illegible] (ජා.මූ)
වෙළෙඳ, වාණිජ [illegible] සහ
සමුපකාර සංවර්ධන අමාත්‍ය
අංක 492, ආර්.ඒ. ද මැල් මාවත,
කොළඹ 03.


ජාත්‍යන්තර ක්‍රම වේදයන්ද පදනම් කර ගනිමින් පනත යාවත්කාලීන කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගන්නා ලෙසත්, එම ක්‍රියාදාමයේදී ජාතික බුද්ධිමය දේපල කාර්යාලයට මුහුණ දීමට සිදුව ඇති අපහසුතා සහ බාධක සම්බන්ධයෙන් කාරක සභාවට වාර්තා කරන ලෙසත්, ප්‍ර.ග.නි සහ ග.නි වෙත කාරක සභාව විසින් නිර්දේශ කරන ලදි.	
07. ලංකා සතොස ආයතනය පවතින ගොඩනැගිල්ලේ පවතින එම ඉඩකඩ ආයතනයේ පැරණි ලිපිගොනු ගබඩා කිරීමට යොදා ගත යුතු බව සහ අනවශ්‍ය පැරණි ලිපිගොනු 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ පනතට අනුකූලව අපහරණය කළ යුතු බවත් ඒ සඳහා පළමුව 2006 වසර සිට 2016 දක්වා පවත්වා ගෙන යනු ලැබූ එහෙත් මේ වන විට ක්‍රියාත්මක නොවන ලිපිගොනු සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ගයන් අනුගමනය කර ප්‍රසිද්ධ පුවත්පත් සහ වෙනත් සුදුසු දැන්වීම් පල කර මහජනතාව දැනුවත් කර, ඒවා නියමිත කාලවකවානු තුළ නියමිත ආකාරයෙන් අපහරණය කළ යුතු බවටත් ප්‍ර.ග.නි සහ ග.නි වෙත නිර්දේශ කළ කාරක සභාව සමාගම මැදුරේ බිම් මහලේ සහ පස්වෙනි මහලේ ඌන උපයෝජනයක් සහිත ඉඩකඩ පවතින බව විගණකාධිපති වාර්තා වලින් සනාථ වී ඇති බැවින්, මෙම ලිපිගොනු ස්කෑන් කිරීමේ ව්‍යාපෘතිය අවසන් වන තෙක් හෝ තාවකාලික පදනමින් වර්තමාන ගොඩනැගිල්ලෙන්ම ඉඩකඩ සපයා ගැනීමට සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත නැවත ඉල්ලීමක් සිදු කරන ලෙසද, කලාපයේ අනෙකුත් රටවල බුද්ධිමය දේපල කාර්යාලයන් පවත්වාගෙන යාමේ සහ නඩත්තු කරගෙන යාමේ ක්‍රමවේදයන් සහ ඒ සඳහා යොදාගෙන ඇති	මෙම කාර්යාලයේ පවතින ඉඩකඩ ප්‍රමාණවත් නොවීමේ ගැටළුව සහ ලිපිගොනු ගබඩා කිරීමේ ගැටළුව සඳහා මෙතෙක් විසඳුමක් ලැබී නොමැති අතර ලිපිගොනු ස්කෑන් කිරීමේ ව්‍යාපෘතියේ කටයුතු අවසන් කර ඇති අතර මේවන විට ලේක්හවුස් ආයතන පරිශ්‍රයේ වර්ග අඩි 12500 බිම් ප්‍රමාණයක් කුලී පදනම මත මෙම කාරයාලය වෙත ලබාගැනීම සඳහා ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.

වසන්ත සමරසිංහ (ජා.ම)
වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතභාව සහ
සමුපකාර සංවර්ධන අමාත්‍ය
අංක 492, ආර්.ඒ. ද මැල් මාවත,
කොළඹ 03.

සුහුරු(smart) ක්‍රමවේදයන් කවරේද යන්නත් සොයා බලා ඒ පිළිබඳව කාරක සභාවට වාර්තා කරන ලෙසටද ප්‍ර.ග.නි සහ ග.නි වෙත තවදුරටත් නිර්දේශ කරන ලදී.	
08. ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපල කාර්යාලය සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකිරීම සම්බන්ධයෙන් මේ වන විට ක්‍රියාත්මක වැඩපිලිවෙල	ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය සඳහා ගොඩනැගිලි පහසුකම් සලසා ගැනීම සඳහා වූ ප්‍රසම්පාදනය ආරම්භ කර ජාතික තරගකාරී ලංසු ක්‍රමය මගින් 2026.08.13 දින ලංසු කැඳවනු ලැබිණි. ඒ අනුව එක් ලංසුකරුවකු ලංසු ඉදිරිපත් කර ඇති අතර එය ලංසු ඇගයීම සඳහ ලංසු ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් කර ඇත. ලංසු ඇගයීම් කමිටුව විසින් භෞතික පරීක්ෂා කර ඇති අතර තව දුරටත් ලංසුකරු වෙතින් ලබා ගැනීමට අවශ්‍ය ලේඛන හා පැහැදිලි කිරීම් ලබා ගැනීමට අවශ්‍ය බව ලංසු ඇගයීම් කමිටු සභාපති විසින් 2026.08.28 දින ඉල්ලීම් කර ඇත. ඒ අනුව අදාල ඉල්ලීම එදිනම ලංසුකරු වෙත යොමු කර ඇත. එම තොරතුරු මෙතෙක් ලැබී නොමැති අතර එම තොරතුරු ලද විගස ලංසු ඇගයීම් කමිටුවට ඉදිරිපත් කිරීමට නියමිතය. එම කමිටු වාර්තාව ලද පසු එය දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවට ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.
09. ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය විසින් සිදු කරන ලද මෙම බරපතල වරද හේතුවෙන් එම මුදල් මහා භාණ්ඩාගාරයෙන් සපයා ගැනීම නිසි ක්‍රම වේදය නොවන බවත්, එනිසා ඉදිරි මාස 03 ඇතුළත එම මුදල ශ්‍රී ලංකා තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය වෙතින් අයකර ගැනීමට ගත හැකි සියළුම ක්‍රියාමාර්ගයන් ගන්නා ලෙසත් කාරක සභාව විසින් ප්‍රග.නි වෙත නිර්දේශ කරන ලදී.	2026 මාර්තු 04 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒජන්සිය (ICTA) විසින් 2026 මැයි 26 දිනැති අංක 700918 දරණ චෙක්පත මගින් ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය (NIPO) වෙත ගෙවිය යුතු රුපියල් මිලියන 32.5ක මුදල ආපසු ගෙවා ඇත. එම චෙක්පත 2026 මැයි 27 දින NIPO වෙත ලැබී ඇති අතර, අනතුරුව ශීර්ෂ අංක 299 යටතේ පවත්වාගෙන යනු ලබන නිල බැංකු ගිණුමට තැන්පත් කර ඇත. අදාළ මුදල 2026 ජූනි 01 දින නිෂ්කාශනය වී ඇති බව දන්වා සිටිමු.
10. එම මධ්‍යස්ථානයන් සඳහා මූල්‍යමය සහායක් සපයා ගැනීම සඳහා ඒවායේ සේවය අවශ්‍ය වන්නා වූ වෙනත් රාජ්‍ය ආයතනයන් සමඟ සම්බන්ධීකරණයෙන් මෙම මධ්‍යස්ථානයන් තවදුරටත් ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික බුද්ධිමය දේපල කාර්යාලයට මැදිහත් විය හැකි සියළුම අංශයන් පිළිබඳ පූර්ණ අධ්‍යයනයක් සිදු කර, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ අධ්‍යාපන	2025.07.31 දින අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලද TISC ව්‍යාපෘතිය වඩා ක්‍රමානුකූල කිරීමට අදාල සංකල්ප පත්‍රිකාව රාජ්‍ය ගිණුම් කාරක සභාව වෙත යොමු කිරීම සඳහා වෙළඳ අමාත්‍යාංශය වෙත 2025.12.05 දින ඉදිරිපත් කර ඇත.

විසාඛා සමරසිංහ (ජා.මූ)
වෙළෙඳ, වාණිජ, කාසාර සුවාංමිතතා සහ
සමුපකාර අමාත්‍යාංශ ලේකම්
ඉලක්ක 492, ආර්.ඒ. ඩී මැල් මාවත,
කොළඹ 03.

අමාත්‍යාංශය සමඟද සාකච්ඡා කර ඒ සඳහා සුදුසු යෝජනාවලියක් සහ සංකල්ප පත්‍රිකාවක් කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි සහ ගනි වෙත කාරක සභාව විසින් නිර්දේශ කරන ලදි.	
11. ඒ සඳහා අවශ්‍ය අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා ගැනීමේ ප්‍රමාදයට හේතුව නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව පාර්ශවයෙන් පවතින ප්‍රමාදය බව කාරක සභාවට දන්වා සිටියෙන්, එකී දෙපාර්තමේන්තුව සමඟ සහයෝගිව කටයුතු කර සංශෝධන ඇතුළත් කෙටුම්පත කඩිනමින් සකස් කර ගන්නා ලෙස කාරක සභාව විසින් ප්‍ර.ග.නි වෙත නිර්දේශ කරන ලදී.	භූගෝලීය දර්ශක ලියාපදිංචියට අදාල කාර්ය පටිපාටිය සඳහා වන රෙගුලාසි 2024.10.22 දරන දිනෙන් යුතු ගැසට් පත්‍රයේ පල ගැසට් කර ඇත. ඒ අනුව, නිල වශයෙන් භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීම 2025 වසරේ පෙබරවාරි මාසයේදී ආරම්භ කරන ලදී. ඒ අනුව භූගෝලීය දර්ශක ක්‍රියාත්මක වෙමින් පවතී.



වසන්ත සමරසිංහ (ආ.ම)
වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතභාව ඇමැතිතුමා
සමුපකාර සංවර්ධන අමාත්‍ය
අංක 492, ආර්.ඒ. ද මැල් මාවත,
කොළඹ 03.